මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහේක්ෂණ කාර්යාලය, අංක 02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல 02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : 2026/06

2026.11.13

මැතිවරණ කොමිෂන් සභාව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නියෝජිතයන් සමඟ 2026.11.06 දින පැවැත් වූ සාකච්ඡාව

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිළිගත් දේශපාලන පක්ෂයකි. කෙසේ වෙතත් 2025 වර්ෂයේ සිට ප්‍රතිවිරුද්ධ කණ්ඩායම් අතර මතු වූ ලේකම් ධුරය සම්බන්ධ ගැටළුවක් මත ලේකම් ධුරයේ ගැටළු සහිත පක්ෂයක් ලෙස නම් කර ඇත.

මෙම ගැටළුව විසඳන ලෙසට ලැබුණු ඉල්ලීම් මත ඒ හා සම්බන්ධ දෙපාර්ශ්වය 2026.11.06 වන දින මැතිවරණ කොමිෂන් සභාවට කැඳවා සාකච්ඡා කරන ලදී . එම සාකච්ඡාවේ දී දෙපාර්ශ්වයේම එකඟත්වය මත තීරණය වූයේ ලේකම් ධුරයේ ගැටළුව සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සිවිල් අභියාචන මහාධිකරණයේ (කොළඹ) දැනට විභාග වෙමින් පවතින නඩුවේ තීන්දුවක් ලැබුණ පසුව තීරණයක් ගැනීම සුදුසු බවයි.

මෙම නිවේදනය නිකුත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිළිගත් දේශපාලන පක්ෂයක් නොවන බවට අසත්‍ය ප්‍රචාර මාධ්‍ය මඟින් සංසරණය වී ඇති නිසා බව වැඩිදුරටත් නිවේදනය කරමි.

ආර්.එම්.ඒ.එල්.රත්නායක
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි